

# ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන සංඝනායක පදවියෙන් පිදුම් ලබන මීගහකුඹුරේ ධම්මගවේසී නා හිමි



**මහා විහාරවංශික සයාමෝපාලි මහා නිකායේ මල්වතු පාර්ශවයේ ශ්‍රීමත් මහානායක තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහානායක ස්වාමීන් වහන්සේ ප්‍රධාන ගරුතර කාරක මහා සභා සංඝ සභාව විසින් "සද්ධර්ම කීර්ති ශ්‍රී මංගල"යන ගෞරව නාම සම්මුතිය පිදූ වගයි**

1992 වෙසක් පුණු පොහෝ දින ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවරට පැමිණ, සිය ප්‍රථම ධර්ම අනුසාසනාව කළ රාජකීය පණ්ඩිත මීගහකුඹුරේ ධම්මගවේසී හිමිපාණෝ සිය දුර දර්ශී දර්ශණය හා කළමණාකරණ නිපුණතා උපයෝගී කර ගනිමින් වර්තමාන ලංකාරාම විහාරය අද්විතීය ජාත්‍යාන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් බවට පත්කොට ඇත.

තමන් වහන්සේ ගේ නමට අතිශයින් ම සරිලන පරිදි ධර්ම ගවේශණයෙහි නියුතු උන්වහන්සේ,පෙර අපර දෙදිග භාෂාන්තර දැනුමෙන් හා මනෝවිද්‍යාව ඇතුළු සමකාලීන විද්‍යා ශාස්ත්‍රීය දැනුමෙන් අනූන වන සේක.

1981 පෙබරවාරි මස 9 වන දින පැවිදි දිවිය වෙත පා තැබූ උන්වහන්සේ ගේ පැවිදි ආචාර්යවරයාණන් වහන්සේ දැනට ඉංගිරියේ මඩකඩ ආරණ්‍ය සේනාධිපති අම්පිටියේ මංගල නා හිමිපාණෝය. 1982 ජූනි මස 7 වන දින උන්වහන්සේ ගේ උපසම්පදා ප්‍රාප්තිය සිදුවූයේ එවකට මල්වතු විහාර පාර්ශවයේ මහානායක ධූරය දැරූ අතිපූජ්‍ය සිරිමල්වත්තේ ආනන්දභිධාන මහා නා හිමිපාණන් ගේ උපාධ්‍යායත්වයෙනි.

පැවිදි ආචාර්යයන් වහන්සේලා ගේ මග පෙන්වීම යටතේ මූලික ධර්ම විනය හදාළ උන්වහන්සේ, කොළඹ හුණුපිටියේ ගංගාරාම විහාරස්ථ පිරිවෙන හා මහරගම සිරි වජිරඥාණ ධර්මායතනයේ වැඩිදුර ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලැබූහ.

එසමයෙහි මඩිහේ පඤ්ඤාසීහ මහානායක හිමිපාණන්ගේ හා අම්පිටියේ රාහුල හිමිපාණන්ගේ ඇසුර ලැබූ උන්වහන්සේ රාජකීය පණ්ඩිත උපාධියද ලැබූහ. 1992 දී සිඩ්නි ලංකාරාම විහාරයේ නියමුවාණන් ලෙස භාරදූර ධර්ම ශාස්ත්‍රීය මෙහෙයක් ඉටුකරන අතර බටහිර සිඩ්නි විශ්ව විද්‍යාලයේ මනෝ මූලික සමාජ විද්‍යා විෂයන් හදාරා සමාජවේදී (B.S.Sc) උපාධිය හිමිකර ගත්හ.

සියලු විහාර අංගයන්ගෙන් සමන්විත අලංකාර බෞද්ධ සිද්ධස්ථානයක් සකස් කිරීමට පුරෝගාමී වූ ධම්මගවේසී හිමිපාණෝ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්ගෙන් නිව්සවුත් වේල්ස් ප්‍රාන්තයට සංක්‍රමණය වී ඇති,නොයෙකුත් රැකියාවන් හි නියුතු පවුල් 1000 ක් පමණ සිය දායකයන් බවට යොමුකරගෙන ඇත. උන්වහන්සේ ගේ අනුශාසකත්වය හා මගපෙන්වීම යටතේ ලංකාරාම දහම් පාසල,තරුණ හමුව,භාවනා වැඩ සටහන් හා දෛනික උපදේශක සේවා අඛණ්ඩ ව සිදුකැරේ. මේ හැර උන්වහන්සේගෙන් කෙරෙන සමාජ හා ප්‍රජාසේවාවන් අතර කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි "සහන වැඩිහිටි නිකේතනය" විශේෂ වැදගත් කමකින් යුක්තය.

දැනට වැඩිහිටියන් 15 දෙනෙකු පමණ මෙහි නේවාසිකව සිටී. කිසිදු අයකිරීමකින් තොරව පවත්වාගෙන යන මෙම ආයතනය දූ දරුවන් සියයකට පමණ වාර්ෂිකව පොත්පත් හා ලිපි ද්‍රව්‍ය බෙදාදීම සිදුකරයි.

නිව්සවුත් වේල්ස් වාසී සැදැහැවතුන් රෝගී වූ අවස්ථාවන්හිදී ඔවුනට ආශිර්වාද පූර්වක සෙත් පැතීම් වලට සහභාගී වීමෙන්ද,පවුල් උපදේශක අනුශාසනා වැඩසටහන් හා විභාගාපේක්ෂක තරුණ තරුණියනට සෙත් පැතීම හා මාර්ගෝපදේශකත්වයද උන්වහන්සේ අතින් කෙරෙන මහඟු සේවාවන් අතර ප්‍රමුඛ ස්ථානයක් ගනී.

ග්‍රන්ථකරණයෙහි විශේෂ දක්ෂතාවයකින් හෙබි ධම්මගවේසී හිමිපාණෝ දැනට ඉංග්‍රීසි හා සිංහලෙන් ධර්ම ග්‍රන්ථ 20ක් පමණ ප්‍රකාශයට පත්කොට තිබේ. දේශීය හා විදේශීය ජනයා අතර දහම් සුවඳ පැතිරවීමේ කාර්යභාරයට මෙමගින් ලැබෙන පිටිවහල ඉමහත්ය.

සිඩ්නි ලංකාරාම බෞද්ධ විහාරය ආරම්භයේ පටන් මේ දක්වා එහි වර්ධනයට මහෝපකාරී වූ රාජකීය පණ්ඩිත මීගහකුඹුරේ ධම්මගවේසී හිමිපාණන් අතින් සිදුවූ අද්විතිය සේවවන් අගයකරනු වස් අප හිමිපාණන් වෙත මහා විහාරවංශික සයාමෝපාලි මහා නිකායේ මල්වතු පාර්ශවයේ ශ්‍රීමත් මහානායක තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහානායක ස්වාමීන් වහන්සේ ප්‍රධාන ගරුතර කාරක මහා සභා සංඝ සභාව විසින් "සද්ධර්ම කීර්ති ශ්‍රී මංගල"යන ගෞරව නාම සම්මුතිය සමග " ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන සංඝනායක පදවිය පිලිබඳ ශ්‍රී සන්නස් පත්‍ර ප්‍රදානෝත්සවය 2013 දෙසැම්බර් මස 14 වනදා මල්වතු මහා විහාරීය උපෝෂථාගාරයේදී උත්සවශ්‍රීයෙන් සිදුකිරීම ඕස්ට්‍රේලියානුවාසීන් ගේද විශේෂ ගෞරවයට කරුණකි.



ක්‍රි.පූ236 මිහිඳු මහ රහතන් වහන්සේ විසින් බුදු දහම ශ්‍රී ලංකා හඳුන්වාදුන් අවසථාවේ ශාසනයේ චිරස්ථිතිය සඳහා "මහා විහාරය"නිර්මාණය කරන ලදී. මහනුවර යුගය තෙක් අඛණ්ඩව පැවති මෙම සම්ප්‍රදාය වැලිවිට අසරණ සරණ සංඝරාජ හිමිපාණ වෙතින් පුනර්ජීවයක් ලැබුණි. ඒ සියමෙන් යළි උපසම්පදා යළි ගෙනැවිත් ශ්‍රී ලංකාවේ සසුන පුනරුත්තාපනය කිරීමත් සමගය.

ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ සාහිත්‍යය හා සංස්කෘතිය ආරක්‍ෂා කොට ගොඩනැංවීමෙහි ලා ඉමහත් කාර්යයක් ඉටුකල මහා විහා සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානයක් බවට සිඩ්නි නුවර ලංකාරාම බෞද් විහාරස්ථානය පත්වීම දේශීය සංස්කෘතිය අගයන බෞද්ධ අබෞද්ධ කාගේත් අමන්දානන්දයට හේතුවනු නොඅනුමානය. සන්නස් පත්‍ර ප්‍රධානය 2013 දෙසැම්බර් මස 14 වනදා සවස මහනුවර මල්වතු මහා විහාරයේදී ද පිලිගැනීමේ උත්සවය දෙසැම්බර් මස 23 වනදා සවස නාවින්න ජයතුංග යෝගාශ්‍රමයෙ දි.මු ජයරත්න අග්‍රාමාත්‍ය තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවකින් අනතුරුව 2014 මාර් මස 30 වන ඉරුදින සිඩ්නි නුවර ලංකාරාම විහාරස්ථානයේ දී බැතිමතුන් රාශියක් සහභාගීවෙමින් උන්වහන්සේ ගේ පදවි ප්‍රාප් නැවත වරක් සමරනු ලැබුවා. මෙදින ඕස්ට්‍රේලියානු බෞද්ධ මධ්‍යස්ථානවල හා අනෙකුත් රටවල භික්ෂූන් වහන්සේලා රැසක් සහභාගීවුනා.

සකැසුම

*ආචාර්ය* **උබයසිරි විජයනන්ද වික්‍රම** *සමග*

**අතුල කල්දෙමුල්ල**







රටවල් 40ක ශ්‍රී ලාංකිකයන් අසන ගුවන්විදුලිය - තිසර www.thisara.com